**මහ කොළඹ අප ජලය කළමනාකරණය ව්‍යාපෘතිය - 2018**

------------------------------------------------------------

මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹී අංක 2557/2558 එස්ආර්අයි දරන ණය ගිවිසුම්වල II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. මහ නගර සභා ප්‍රදේශය ඇතුළත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ මහ නගර සභාව වගකීම දරන අතර කොලොන්නාව නගර සභාව හා දෙහිවල ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශ ඇතුළත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වගකීම දරනු ලැබේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් පිළිබඳ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මනා අප ජලය කළමනාකරණ සේවා සැපයීම මඟින් මහ කොළඹ ප්‍රදේශයේ නාගරික හා උප නාගරික නිවැසියන් සඳහා නාගරික පරිසරය හා මහජන සෞඛ්‍ය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ප්‍රදේශයේ ඇතුළත නිවැසියන් 645,000 ක් සඳහා අප ජලය කළමනාකරණ සේවා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,410 කට සමාන එජඩො මිලියන 116.60 ක් වන අතර, ඉන් රු.මිලියන 9,200.80 කට සමාන එජඩො මිලියන 80 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මඟින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබූ අතර රු.මිලියන 2,300.20 කට සමාන එජඩො මිලියන 20 ක් හෙවත් ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ අරමුදල් සම්පත් මඟින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.1,909 කට සමාන එජඩො මිකියන 16.60 ක් හෙවත් ශ්‍රී ලංකා රජය මඟින් දායක වීම සඳහා සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු.මිලියන 1,731.70 කට සමාන එජඩො මිලියන 12.60 ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. තවද, ප්‍රදානයක් ලෙස සියයට 82.5 ක් හා ණය මුදලක් ලෙස සියයට 17.5 ක මිශ්‍රණයකින් සමන්විත වූ රු.මිලියන 647.68 කට සමාන විගැහි මිලියන 3.6 ක් (එජඩො මිලියන 5.64 ක්) සැපයීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2010 ජූලි 02 දින අතිරේක මූල්‍යායන ගිවිසුමක් අත්සන් කරන ලදී. රු.මිලියන 364.35 කට සමාන ඉතිරි මුදල වන එජඩො මිලියන 3.17 ක මුදල මූල්‍යායනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. 2009 දෙසැම්බර් 18 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2014 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 මාර්තු 30 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද ව්‍යාපෘති කාර්යයන් 2017 දෙසැම්බර් 31 දක්වා කර ගෙන ගොස් තිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ

| විගණිත ගැටලු | රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| --------------- | ----------------- | ---------- | --------------------------- | -------------- |
| (අ) 2018 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද එකතු කිරීමේ අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලත් දායකයට එරෙහිව හිලව් කර තිබුණි. | 72.19 | රජයෙන් ලත් දායකය අව ප්‍රමාණය වේ. | එකතු කිරීමේ අගය මත බදු රජයේ අර මුදල් මගින් හිලව් කල හැක. | ලද ශුද්ධ දායකය වෙනුවට ශ්‍රී ලංකා රජයෙන් ලත් සම්පූර්ණ දායකය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට පැවති විශේෂ (ඩොලර් ) ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 22.22 | වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානදෑහි ශේෂය අව ප්‍රමාණය වේ. | නිසි පරිදි අදහස් දක්වා නොමැත | විශේෂ ( ඩොලර්) ගිණුමේ පැවති ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට කෙරී ගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 10.45 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව කෙරී ගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 1.17 ක් විය. | | අභ්‍යන්තර පාලනයේ දූර්වලතාවයකි | අදහස් දක්වා නොමැත | කාලීනව ශේෂ සැසඳුම් කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) කොන්ත්‍රාත්කරු විසින් ආපසු ගැනීමේ අයදුම්පත් මගින් ඉදිරිපත් කරන ලද බිල්පත් වටිනාකම රු.මිලියන 198.15ට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි. | | ගනුදෙනුව ප්‍රමාණවත් සාක්ෂි මගින් තහවුරු නොවිණි. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් තහවුරු කිරීම සඳහා උපකාරක ලියවිලි ඉදිරිපත් කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය විසින් දෙහිවල, ගල්කිස්ස සහ කොලොන්නාව අප ජල පොම්ප කිරීමේ මධ්‍යස්ථාන 06ක් පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 1,028කට සමාන එ.ජ.ඩො. මිලියන 7.79 කට 2014 අගෝස්තු ප්‍රදානය කර තිබූ අතර 2016 දෙසැම්බර් වන විට නිම කිරීමට මූලිකව සැලසුම් කර තිබුණි. කෙසේ වුව ද ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කාලය 2017 මාර්තු 30 දක්වා දීර්ඝ කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණ කර තිබුණ ද, කොන්ත්‍රාත්කරු සමඟ ඇති වූ ආරවුලක් හේතු කොට පුනරුත්ථාපන කාර්යයන්හි අවසන් බිල 2019 මැයි 30 දින විටත් ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 පද්ධති සහ පාලන

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන ගැටලු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ------------------- | --------- | ----------------------------- | ---------------------- |
| (අ) ව්‍යාපෘති කාලය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද, පොම්ප කිරීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමග ඇති වී තිබෙන බේරුම්කරණ ගැටලු හේතුවෙන් ව්‍යාපෘතියේ කාර්යයන් ඇවර කිරීමට හෝ වත්කම් හා වගකීම් ක්‍රියාත්මක කිරීමේ හා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනයන්ට භාර දීමට හෝ ක්‍රියා කර නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය නොවේ. | අදහස් දක්වා නොමැත | ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘතියේ කටයුතු අවසාන කිරීමට උපදෙස් දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 133 සහ 2016 ජුනි 10 දිනැති කලමනාකරණ විගණන චක්‍ර ලේඛ අංක 02/2016 පරිදි සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණනයට ඇතුලත් වී නොතිබුණි. | අභන්තර පාලන පද්ධතියේ දුර්වලතාවයකි. | එම | ව්‍යාපෘතියේ අරමුදල් කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීම සහතික වීම සඳහා අභ්‍යන්තර විගණකගේ සහය ලබා ගත යුතුය. |
| (ඇ) ව්‍යාපෘති කාර්යය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වුවද ව්‍යාපෘති නිම කිරීමේ වාර්තාව පිළියෙළ කර නොතිබුණි. | ව්‍යාපෘති කාර්යයන්ගේ ප්‍රතිඵල මැනීමට නොහැකි වීම | එම | ව්‍යාපෘති කාලය අවසානයේ ව්‍යාපෘති නිම කිරීමේ වාර්තාවක් සකස් කළ යුතුය. |